# පොලිස් මාධ්‍ය කොට්ඨාසය
## பொலிஸ் ஊடகப் பிரிவு
## POLICE MEDIA DIVISION
සෙත්සිරිපාය, බත්තරමුල්ල

තැ.පෙ.අංකය / த. பெ.இ / Po.Box No — 10120

ෆැක්ස් / தொலைநகல / Fax — 011-2171635

දුරකථන / தொலைபேசி / Telephone — 011-2887973 (HUNTING)

වෙබ්.ලිපිනය / இணையதளம் / Web Site — www.Police.lk

ඊ මේල් / மின்னஞ்சல் / E-mail — dir.media@police.gov.lk


---

මගේ අංකය / எனது இலக்கம் / My NO — 289/2024

ඔබේ අංකය / உமது இலக்கம் / Your No — / 2024

දිනය / திக / Date — 18/02/2024 පැය 0540

## මාධ්‍ය නිවේදනය

**වෙඩි තබා ඝාතනය තැත් කිරීමේ සිද්ධියකට ආධාර අනුබල දුන් සැකකරුවන් දෙදෙනෙකු අත්අඩංගුවට - මීගොඩ පොලිස් ස්ථානය.**

2024.02.12 වන දින මීගොඩ පොලිස් වසමේ ආර්ථික මධ්‍යස්ථානය තුලදී යතුරුපැදියකින් පැමිණි නාඳුනන පුද්ගලයන් දෙදෙනෙකු විසින් ගිනි අවියකින් කාන්තාවකට වෙඩි තබා තුවාල සිදුකර මුදල් කොල්ලකෑමක් සම්බන්ධව මීගොඩ පොලිසිය විසින් විමර්ශනයක් ආරම්භ කර තිබුණි.

මෙම වෙඩි තැබීමට පැමිණි යතුරුපැදිය කඩවත පොලිස් වසමේ කිරිල්ලවල ප්‍රදේශයේ සඟවා ඇති බවට මීගොඩ පොලිසියට ලද තොරතුරක් මත වැටලීමක් සිදුකර එම යතුරුපැදිය, හිස් වැසුමක්, පිහියක් සහ කමිසයක් අවන්හලක කාමරයක් තුල සඟවා තිබියදී 2024.02.17 වන දින සොයා ගෙන ඇත.

මෙම යතුරු පැදිය සඟවා තබාගෙන සිටි අවන්හල් හිමිකරු සහ සැකකරුවන්ට රැඳී සිටීමට නිවස ලබා දී තිබූ සැකකරුවෙකුද පොලිසිය විසින් 2024.02.17 වන දින අත්අඩංගුවට ගෙන ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරුවන් අවුරුදු 39 හා 44 වයස්වල පසුවන ඉඹුල්ගම හා කඩවත ප්‍රදේශවල පදිංචිකරුවන් වේ.**

මීගොඩ පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

**මාධ්‍ය ප්‍රකාශක කාර්යාලය**
**පොලිස් මාධ්‍ය කොට්ඨාසය.**